චක්‍රලේඛ අංක :- 12/2007

මගේ අංකය :- බප/සසේකො/ලේ.කර/2007
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක. 50, කිතුල්වත්ත පාර,
කොළඹ - 08.
2007.12.31.

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමූපකාර සමිති සහ
ආරෝග්‍යශාලා සමූපකාර සමිති සභාපතිවරුන් වෙත.

<u>බස්නාහිර පළාතේ සමූපකාර රෝහල් සහ රෝහල් පවත්වාගෙන යන
සමූපකාර සමිති සඳහා තනතුරු, වැටුප් පරිමාණ සහ සුදුසුකම් නියම කිරීම.</u>

සමූපකාර සමිති විසින් පවත්වාගෙන යන රෝහල් සහ සමූපකාර රෝහල් සඳහා අවශ්‍ය තනතුරු, සුදුසුකම් සහ වැටුප් ක්‍රම පිළිබඳ සකස් කරන ලද අනුමත පරිපාටිවල පිටපතක් මේ සමග එවමි.

02. රෝහල්වලින් තොරව ඖෂධ අලෙවිසැල් පවත්වාගෙන යන සමිති විසින් එම අලෙවිසැල්-වල සේවය කරන ඖෂධවේදීන් සහ අනුමත කාර්ය මණ්ඩලයේ සඳහන් අනෙකුත් සේවකයින් සඳහා මෙම සුදුසුකම් සහ වැටුප් ක්‍රම අනුගමනය කළ හැකිය.

03. දැනටමත් වැටුප් පරිමාණ අංක ලබා දී ඇති තනතුරු වල වැටුප් පරිමාණ අංක මෙම චක්‍රලේඛයේ සඳහන් වැටුප් පරිමාණ අංක අනුව සංශෝධනය කරගත යුතුය.

04. 1993 වසරේදී කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බඳවාගැනීම් පරිපාටිවල ඇතුළත් ~~මෙහි සම-සම~~ තනතුරුවලට අදාල සුදුසුකම් මෙමගින් අහෝසි කෙරේ.

05. මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කරනු ලබන්නේ බ.ප. සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්ගේද එකඟත්වය ඇතිවය.

කොමිෂන් සභාවේ නියමය පරිදිය.

කේ.කේ. සිරිසේන,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

<u>පිටපත්</u>

1. බ.ප. පළාත්මාර්ග හා සමූපකාර අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම්, පළාත්මාර්ග හා සමූපකාර අමාත්‍යාංශය (බ.ප.)
4. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ)
6. ලේකම්, සමූපකාර සේවක කොමිෂන් සභාව
7. සියළුම පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියළුම වෘත්තිය සමිති